UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
2017 අප්‍රේල්
FIRST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL - NEW SYLLABUS) APRIL 2017

SUPE 006: බෞද්ධ උපදේශන මනෝවිද්‍යාව

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. බෞද්ධ උපදේශන මනෝවිද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ සඳහන් කර එහි අරමුණු සහ සීමාවන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

2. වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින සමාජ ප්‍රශ්න හඳුන්වා ඒවායේ ප්‍රභවයට බලපාන හේතු සහ ඒවා සමනය කරගැනීමට උපකාරවන බෞද්ධ උපදේශන විධි ක්‍රම විස්තර කරන්න.

3. 'ශක්තිමත් ජාතියක් ගොඩනැගීමට පදනම වන්නේ පවුලයි.' බෞද්ධ පවුල් උපදේශනය තුළින් මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න.

4. බෞද්ධ උපදේශකයකුගේ ගුණාංග පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් කරන්න.

5. බටහිර උපදේශන මනෝවිද්‍යාව හඳුන්වා එහි ආරම්භය, විකාශය සහ එමගින් මානසික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

6. විල්හෙල්ම් වුන්ඩ්, විලියම් ජේම්ස්, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් සහ කාල් ජුන්ග් යන මනෝ විද්‍යාඥයින් නූතන මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි ලා කෙසේ දායක වූවාහු දැයි සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

7. බෞද්ධ පාරිසරික මනෝවිද්‍යාව යනු කුමක්දැයි හඳුන්වා එහි විෂය ක්ෂේත්‍රය පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් කරන්න.

8. පාරිසරික මනෝවිද්‍යාත්මක සිද්ධාන්ත පාරිසරික චර්යාව පිළිබඳ පර්යේෂණය කිරීමේ දී කිනම් ආකාරයක සහායක් ලබා දෙන්නේ ද යන්න පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

9. වර්තමානයේ ශ්‍රී ලංකාවෙහි සිදුවන පාරිසරික විනාශය මුලිනුපුටා දැමීමට බෞද්ධ පාරිසරික මනෝවිද්‍යාවෙහි අදාළත්වය පැහැදිලි කරන්න.

10. මිනිසාගේ චර්යාවන් කෙරෙහි පාරිසරික සාධක බලපාන්නේ කෙසේ දැයි බෞද්ධ පාරිසරික මනෝවිද්‍යාව ඇසුරින් උදාහරණ සහිතව විස්තර කරන්න.

==========